# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන)

**1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා විසින් 2019 මැයි මස 07 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 ඔක්තෝබර් මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[278 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්ති මඟින්, 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර, එහි නීතිය බලපෑම වනුයේ "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන නාමය "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" ලෙස වෙනස් කිරීමයි.

***3 වන වගන්තිය සහ 4 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින් කරනු ලබන සංශෝධන 2 වන වගන්තිය මගින් කරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

## ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන)

එල්.ඩී.— ඕ. 54/2018

### 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2019 අංක දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1968 අංක 15 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ දීර්ඝ නාමයේ "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන වචන යෙදෙන සෑම ස්ථානයකම, ඒ වෙනුවට "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන වචන ආදේශ කිරීමෙන් එකී දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට සහ වෙනත් ලිඛිත නීතිවලට වූ පොදු සංශෝධනය.

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන වචන යෙදී ඇති සෑම ස්ථානයකම ඒ වෙනුවට "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) සෑම නිවේදනයක, දැන්වීමක, කොන්ත්‍රාත්තුවක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක ඇති "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" සම්බන්ධයෙන් වන සෑම යෙදුමක්ම "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන වචන සඳහන් කරන ලද යෙදුමක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

සැක දුරුකිරීම.

**4.** සැක දුරුකිරීම සඳහා "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" සියලු කාර්ය සඳහා "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන්නෙහි අනුප්‍රාප්තිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.